අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2012 දෙසැම්බර්

General Certificate of Education (Ord. Level) Examination – December 2012

බුද්ධ ධර්මය I / පැය තුනයි

Buddhism I / Three hours

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

---

01. "ස්වාමීනි, මා වැන්නකු වෙනත් ආගමක් වැළඳ ගත්තේ නම් බොහෝ ඉහළින් පිළිගනු ඇත. නමුත් ඔබ වහන්සේ තවදුරටත් සිතා කටයුතු කරන්නැ'යි මා හට පැවසීමෙන් මම පුදුමයට පත් වෙමි."
බුදුරජාණන් වහන්සේට මෙලෙස පැවසුවේ,
(1) අභයරාජ කුමාරයා ය. (2) උපාලි ගෘහපති පුත්‍රයා ය.
(3) චංකී බ්‍රාහ්මණයා ය. (4) කසීභාරද්වාජ බ්‍රාහ්මණයා ය.

02. බුදුරජාණන් වහන්සේගේ අප්‍රමාණ ගුණ සමුදය සමකාලීන බමුණු පූජකවරු පවා වර්ණනා කළහ. සෝණදණ්ඩ බමුණා ද එසේ බුදුගුණ වර්ණනා කළ අයෙකි. ඔහු කළ වර්ණනාවට අයත් **නොවන** කරුණ වන්නේ,
(1) පරිවාර සම්පත් අතහැර පැවිදි වූ බව යන්නයි.
(2) ශ්‍රේෂ්ඨ ආචාර්යවරයකු බව යන්නයි.
(3) සත්මුතු පරපුර දක්වා පිරිසිදු බමුණු කුල ඇති බව යන්නයි.
(4) දෙව්බඹුන් පවා උන්වහන්සේ සරණ ගිය බව යන්නයි.

03. "බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද චතුරාර්ය සත්‍යයේ හා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අන්තර්ගත සාරගර්භ කරුණු අභිභවා යන වෙනත් කිසිම ආගමික ඉගැන්වීමක් නොමැත." මෙලෙස ප්‍රකාශ කළේ,
(1) එච්.ජී. වෙල්ස් ය. (2) එඩ්වින් අර්නෝල්ඩ් ය.
(3) සර්වපල්ලි රාධා ක්‍රිෂ්ණන් ය. (4) රීස් ඩේවිඩ්ස් ය.

04. සුද්ධෝදන රජතුමා තම පුත් සිද්ධාර්ථ කුමාරයාට පළමුවරට නමස්කාර කළේ,
(1) පියවර සතක් ගමන්කොට අභීත කේසර සිංහ නාද පැවැත් වූ අවස්ථාවේ දී ය.
(2) අසිත තවුසා නමස්කාර කළ අවස්ථාවේ දී ය.
(3) වප් මඟුල් දින භාවනානුයෝගී ව සිටි අවස්ථාවේ දී ය.
(4) බමුණු පඬිවරුන් නම් තැබීමට පැමිණි අවස්ථාවේ දී ය.

05. මහාභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් තවුසා සත්‍යය සොයා පළමුව ගියේ,
(1) ආළාරකාලාම, කාලදේවල තවුසන් වෙත ය. (2) අසිත, ආළාරකාලාම තවුසන් වෙත ය.
(3) කාලදේවල, උද්දකරාමපුත්ත තවුසන් වෙත ය. (4) ආළාරකාලාම, උද්දකරාමපුත්ත තවුසන් වෙත ය.

06. සිදුහත් බෝසතාණන් චතුරාර්ය සත්‍යාවබෝධය සඳහා බෝමැඩ භාවනානුයෝගී ව වැඩ සිටි ආසනය හැඳින්වෙනුයේ,
(1) වජ්‍රාසනය නමින් ය. (2) යෝගාසනය නමින් ය.
(3) වීරාසනය නමින් ය. (4) පද්මාසනය නමින් ය.

07. තත්කාලීන භාරතීය ආගමික සමාජයේ පැවැති අන්තගාමී පිළිවෙත් දෙකෙහි ඇති අසාර්ථකත්වය අත්දකීමෙන් ම අවබෝධ කරගත් සිදුහත් තාපසතුමන් සත්‍යාවබෝධය සඳහා අනුගමනය කළේ,
(1) අප්‍රාණික ධ්‍යානයයි. (2) සමජීවිකතාවයි.
(3) මධ්‍යම ප්‍රතිපදාවයි. (4) ආනාපානසති භාවනාවයි.

08. තෘෂ්ණාවෙන්, මානයෙන්, වැරදි දෘෂ්ටියෙන් තොර ව, කරුණාවෙන් හා උපාය කුසලතාවෙන් යුතු ව දානා දී පුණ්‍යකර්ම සිදුකරන විට එය,
(1) අත්තුපනායික ධර්ම නම් වේ. (2) පාරමිතා ධර්ම නම් වේ.
(3) ලෝකාධිපති ධර්ම නම් වේ. (4) අසදෘශ මහා දන නම් වේ.

EXAMMOOD.LK

09. දන සීලා දී ගුණධර්ම පුහුණු කිරීමේ දී බාහිර වස්තු පමණක් නොව, අත් පා ආදී ශරීරාංග ද පරිත්‍යාග කරමින් ගුණ දහම් පිරීම හැඳින්වෙන්නේ,
(1) පාරමී නමිනි. (2) උපපාරමී නමිනි.
(3) පරමත්ථ පාරමී නමිනි. (4) ප්‍රතිපත්ති පූජා නමිනි.

10. අප මහා බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය හෙළිවන ජාතක කථාව නම්,
(1) මඝ මානවක ජාතකයයි. (2) තේමිය ජාතකයයි. (3) සීල වීමංස ජාතකයයි. (4) වට්ටක ජාතකයයි.

11. බොදු දරුවන් වන අප ත්‍රිවිධරත්නය පිළිබඳ කරුණු දැන අවබෝධයෙන් තෙරුවන් සරණ ගිය පිරිසක් බවට පත්විය යුතු අතර, තෙරුවන පිළිබඳ කරුණු දැනීමෙන් ඇතිවන පැහැදීම ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) අවෙච්චප්පසාද යනුවෙනි. (2) අමූලිකා සද්ධා යනුවෙනි.
(3) නිර්වාණාවබෝධය යනුවෙනි. (4) මාර්ගගාමී වීම යනුවෙනි.

12. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී හා අර්හත් යන සතර මග සතර ඵල අවබෝධ කරගත් උතුමන් ධර්මයෙහි හැඳින්වෙන්නේ,
(1) සිව්වනක් පිරිස නමිනි. (2) උභතෝ සංඝ නමිනි.
(3) ත්‍රෛකාලික මහා සංඝ නමිනි. (4) අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ නමිනි.

13. "ආගන්තුකයන් සඳහා සූදානම් කළා වූ ආහාරය වුව ද පිළිගැන්වීමට සුදුසු" යන සංඝරත්නයේ ගුණය ප්‍රකාශ වන්නේ,
(1) 'ආහුණෙය්‍ය' යන්නෙනි. (2) 'පාහුණෙය්‍ය' යන්නෙනි.
(3) 'දක්ඛිණෙය්‍ය' යන්නෙනි. (4) 'අඤ්ජලිකරණීය' යන්නෙනි.

14. බිම්බිසාර රජතුමා හා විශාඛා මහා උපාසිකාව බුදුරජාණන් වහන්සේට පූජා කළ ආරාම **දෙක** නම්,
(1) වේළුවනාරාමය හා ජේතවනාරාමයයි. (2) වේළුවනාරාමය හා න්‍යග්‍රෝධාරාමයයි.
(3) වේළුවනාරාමය හා පූර්වාරාමයයි. (4) පූර්වාරාමය හා ඝෝෂිතාරාමයයි.

15. "ඵුට්ඨස්ස ලොක ධම්මෙහි චිත්තං යස්ස න කම්පති" යන මෙම ගාථාවෙන් ඉගැන්වෙන්නේ,
(1) සැප දුක දෙක සමබර වන බවයි. (2) සුදුසු පෙදෙසක විසීම මඟුල් කරුණක් වන බවයි.
(3) ලෝක ධර්ම අධිපති කොට විසිය යුතු බවයි. (4) අටලෝ දහම්හි කම්පා නොවිය යුතු බවයි.

16. බුද්ධාදී අටතන්හි ඇති කර ගන්නා සැකය හෙවත් වැනෙන සුළු ගතිය ධර්මයෙහි හඳුන්වනු ලබන්නේ,
(1) ව්‍යාපාද වශයෙනි. (2) ථිනමිද්ධ වශයෙනි.
(3) උද්ධච්ච කුක්කුච්ච වශයෙනි. (4) විචිකිච්ඡා වශයෙනි.

17. සිත කිලිටි කරලන, නිවන් මග අවුරාලන, ක්ලේශ ධර්ම ලෙස සැලකෙන පංච නීවරණ ධර්ම යටපත් කරලන භාවනාව නම්,
(1) සමථ භාවනාවයි. (2) විපස්සනා භාවනාවයි. (3) අසුබ භාවනාවයි. (4) අප්‍රාණික ධ්‍යානයයි.

18. කරණීයමෙත්ත සූත්‍රයේ සඳහන් පරිදි තමන් බලාපොරොත්තු වන ආගමික පරමාර්ථය සාර්ථක කරගනු කැමති පුද්ගලයා විසින් ඇති කර ගත යුතු යයි දේශනා කළ ගුණාංග අතර "පහසුවෙන් යමක් කියා ඒත්තු ගැන්විය හැකි වීම" හැඳින්වෙන්නේ,
(1) සක්කෝ නමිනි. (2) සුවචෝ නමිනි. (3) සුභරෝ නමිනි. (4) නිපකෝ නමිනි.

19. මවක තම එක ම පුතු දිවි පුදා ආරක්ෂා කරන්නාක් මෙන් සියලු සත්ත්වයින් කෙරෙහි අසීමිත ව මෛත්‍රිය වැඩිය යුතු බව දක්වෙන ගාථා පාඨය වන්නේ,
(1) "භූතා වා සම්භවෙසීවා - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" යන්නයි.
(2) "න පරො පරං නිකුබ්බෙථ - නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි" යන්නයි.
(3) "මාතා යථා නියං පුත්තං - ආයුසා එක පුත්තමනුරක්ඛෙ" යන්නයි.
(4) "මෙත්තං ච සබ්බලොකස්මිං - මානසං භාවයෙ අපරිමාණං" යන්නයි.

20. මෙත් වැඩීමේ ආනිසංස ගණයට ඇතුළත් **නොවන** කරුණක් වන්නේ,
(1) නපුරු සිහින නොදැකීම යන්නයි. (2) මිනිසුන්ට ප්‍රියවීම යන්නයි.
(3) සිත වහා සමාධිගත වීම යන්නයි. (4) සිහි මුළා වී කළුරිය කිරීම යන්නයි.

EXAMMOOD.LK

21. "වෛරයෝ කිසිකලෙකත් වෛරයෙන් නොසන්සිඳෙත්", ඒ බව අවධාරණය කරමින් දේශනා කළ ධම්ම පද ගාථාවේ මුල් **දෙපදය** වන්නේ,
    (1) "අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ" යන්නයි.
    (2) "නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං" යන්නයි.
    (3) "සාරං ච සාරතො ඤත්වා - අසාරං ච අසාරතො" යන්නයි.
    (4) "සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" යන්නයි.

22. "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි", යන දේශනා පාඨය අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීමට නම් ඊට,
    (1) චේතනාව පැවැතීම අත්‍යවශ්‍ය වේ.
    (2) ඉන්ද්‍රිය පැවතීම අත්‍යවශ්‍ය වේ.
    (3) අරමුණු පැවතීම අත්‍යවශ්‍ය වේ.
    (4) දෘෂ්ටිය පැවැතීම අත්‍යවශ්‍ය වේ.

23. දස අකුසල් අතරට ගැනෙන දැඩි ලෝභය හඳුන්වනු ලබන්නේ,
    (1) ව්‍යාපාදය ලෙසිනි.
    (2) මිථ්‍යා දෘෂ්ටිය ලෙසිනි.
    (3) අභිධ්‍යාව ලෙසිනි.
    (4) මච්ඡරිය ලෙසිනි.

24. කර්මය පිළිබඳ බෞද්ධ විග්‍රහය අනුව සාංසාරික ජීවිතයේ කවර අවස්ථාවක හෝ විපාක ලබා දෙන කර්ම හැඳින්වෙන්නේ,
    (1) දිට්ඨධම්ම වේදනීය කර්ම වශයෙනි.
    (2) උපපජ්ජ වේදනීය කර්ම වශයෙනි.
    (3) අපරාපරිය වේදනීය කර්ම වශයෙනි.
    (4) අහෝසි කර්ම වශයෙනි.

25. ගුරුතුමා එදින බුද්ධ ධර්මය පාඩමට පිවිසුණේ පුවත්පතේ පළ වී තිබූ පුවතක් පෙන්වමිනි. එහි පළ වී තිබුණේ දේපළ බෙදා දීම පිළිබඳ උරණ වූ පුතකු විසින් තම පියා ඝාතනය කරනු ලැබ ඇති බවයි. ඊළඟ භවයේ ඒකාන්ත වශයෙන් විපාක දෙන මෙම අකුශල කර්මය, බුදු දහමෙහි පැවසෙන්නේ,
    (1) ගරුක කර්ම නමිනි.
    (2) ආසන්න කර්ම නමිනි.
    (3) ආචිණ්ණ කර්ම නමිනි.
    (4) කටත්තා කර්ම නමිනි.

26. "ඉමස්මිං සති ඉදං හොති. ඉමස්මිං අසති ඉදං න හොති". මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මෙම ධර්ම පර්යාය හැඳින්වෙන්නේ,
    (1) අහේතු අප්පච්චයතාවාදය නමිනි.
    (2) අධිච්ච සමුප්පන්නවාදය නමිනි.
    (3) අකිරියවාදය නමිනි.
    (4) පටිච්චසමුප්පාදය නමිනි.

27. බෞද්ධ හේතුඵල ධර්මය අනුලෝම වශයෙන් දක්වන තැන "කුසලාකුසල රැස්කිරීම ඇති කල්හි විඤ්ඤාණය ඇති වේ"යන්න ප්‍රකාශ වන්නේ,
    (1) "අවිජ්ජා පච්චයා සංඛාර" යන්නෙනි
    (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නෙනි.
    (3) "විඤ්ඤාණ පච්චයා නාම රූපං" යන්නෙනි.
    (4) "උපාදාන පච්චයා විඤ්ඤාණං" යන්නෙනි.

28. පෝදා ධර්මදේශනාව පැවැත් වූ ගරුතර ස්වාමීන් වහන්සේ දේශනා කළේ මානසික ව්‍යාකූලත්වයට හා කැළඹුණු ස්වභාවයට පත් ව ඇති ජන සමාජයට සහනය ලබා ගැනීමට අවශ්‍ය කරුණු බුදු දහමේ අන්තර්ගත වන බවයි. එම කරුණු අතරට ඇතුළත් **නොවන** කරුණ වන්නේ,
    (1) බෞද්ධ භාවනා ක්‍රම පුරුදු පුහුණු කිරීම යන්නයි.
    (2) සරල චාම් ජීවන ක්‍රමයකට හුරු පුරුදු වීම යන්නයි.
    (3) සැදැහැ සිතින් බෞද්ධ වත් පිළිවෙත් පිරීම හා වන්දනාමාන කිරීම යන්නයි.
    (4) දේවාලවලට ගොස් පුද පූජා පැවැත්වීම යන්නයි.

29. ගිහි ජනයා විසින් සදිසා නමස්කාරයෙහි උඩ දිශාව නියෝජනය කරන ශ්‍රමණ, බ්‍රාහ්මණ පැවිදි උතුමන්ට ඉටු කළ යුතු යුතුකම් අතරට අයත් **නොවන** කරුණ වන්නේ,
    (1) මෛත්‍රී සහගත සිත් පහළකර ගැනීමයි.
    (2) නිවසට පැමිණෙන විට සතුටින් පිළිගැනීමයි.
    (3) ආමිසයෙන් සංග්‍රහ කිරීමයි.
    (4) ඇසූ දේ වඩාත් පැහැදිලි කරදීමයි.

30. දැහැමි රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් වූ දස රාජධර්ම අතර දැහැමි පාලකයකු ජනතා ප්‍රශ්නවල දී පක්ෂග්‍රාහී නොවී සතර අගතියෙන් තොර ව අවංක ව යුක්තිය ඉටු කිරීම හැඳින්වෙන්නේ,
    (1) ඍජු බව නමිනි.
    (2) මෘදු බව නමිනි.
    (3) අක්‍රෝධය නමිනි.
    (4) අවිහිංසාව නමිනි.

EXAMMOOD.LK

31. පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා තම සහෝදර ශිෂ්‍ය නායකයින් අමතා මෙසේ පැවසී ය.
"සමාජයේ අනික් අය වැරදි වැඩ කළත් වැරදි වැඩවලින් වැළකී පිරිසිදු සිතින් ඉන්න අපට පුළුවන් වෙන්න ඕන. එය බෞද්ධ ප්‍රතිපදාවක්." ඔහු පෙන්වා දෙන මෙම ප්‍රතිපදාව බුදු දහමෙහි හැඳින්වෙන්නේ,
(1) 'අගාරික ප්‍රතිපදාව' නමිනි. (2) 'අනගාරික ප්‍රතිපදාව' නමිනි.
(3) 'සල්ලේඛ ප්‍රතිපදාව' නමිනි. (4) 'මධ්‍යම ප්‍රතිපදාව' නමිනි.

32. බොහෝ කාලයකට පසු කිසියම් සමයක දී මේ ලෝකය හැකිළෙන බවත්, තවත් බොහෝ කාලයකට පසු දිග හැරෙන බවත් පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ හේතුඵල සම්බන්ධතාව මත විශ්වයේ පරිණාමය පැහැදිලි කළ කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) අග්ගඤ්ඤ සූත්‍රයයි.
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි. (4) අරුණවතී සූත්‍රයයි.

33. "මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව, සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා ය." යන්න පෙරදැරි කරගෙන කටයුතු කළ රාජ්‍ය පාලකයා නම්,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) කාවන්තිස්ස රජතුමා ය.
(3) දුටුගැමුණු රජතුමා ය. (4) වළගම්බා රජතුමා ය.

34. "සිංහල දරුවනි, පළමුකොට පිරිසිදුකම ඉගෙන ගත යුතුයි. දිවි යතත් බොරුවක් මුසාවක් නොකිය යුතුයි. ගවමස් නොකෑ යුතුයි." මේ ආකාරයෙන් අවවාද උපදෙස් ලබා දෙමින් බෞද්ධ ප්‍රබෝධයක් ඇති කරලීමට කටයුතු කළේ,
(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය. (2) අනගාරික ධර්මපාලතුමා ය.
(3) සර් හෙන්රි ඕල්කට්තුමා ය. (4) වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා ය.

35. බුදු සිරිතේ පුරිසදම්මසාරථී ගුණය විස්තර කරමින් අමාවතුර ද බුදු දහම විවරණය කරමින් ධර්ම ප්‍රදීපිකාව ද රචනා කළ කතුවරයා නම්,
(1) ගුරුළුගෝමී ය. (2) විද්‍යාචක්‍රවර්තී ය.
(3) ධර්මසේන හිමි ය. (4) වීදාගම මෛත්‍රී හිමි ය.

36. මහජනතාවට උපදේශ සපයමින් සදාචාර සංවර්ධනය හා සමාජ යහපත සඳහා ම ලියවුණු උපදේශ කාව්‍ය ග්‍රන්ථ **තුනක්** ලෙස හැඳින්වෙන්නේ,
(1) දහම් ගැට මාලය, බුදුගුණාලංකාරය හා ලෝකෝපකාරයයි.
(2) කාව්‍යශේඛරය, සුභාෂිතය හා ලෝකෝපකාරයයි.
(3) කව්සිළුමිණ, ලෝකෝපකාරය හා සුභාෂිතයයි.
(4) ලෝවැඩ සඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරයයි.

37. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ අවස්ථාවේ "ඇවැත්නි, නොහඬව්. නොවැළපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණෝ වෙමු." යනුවෙන් ප්‍රකාශ කළේ,
(1) සුදින්න භික්ෂුවයි. (2) සුධම්ම භික්ෂුවයි. (3) සුභද්‍ර භික්ෂුවයි. (4) ධර්මාරාම භික්ෂුවයි.

38. පළමු ධර්ම සංගායනාවේ දී ධර්ම විනය කට පාඩමින් රැකගෙන යාමට භික්ෂු පරම්පරාවන්ට පැවරුණු අතර, ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පරපුරට පැවැරුණේ,
(1) දීඝ නිකායයි. (2) මජ්ඣිම නිකායයි. (3) අංගුත්තර නිකායයි. (4) සංයුත්ත නිකායයි.

39. ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රමාණයේ ස්තූපවල ආරක්ෂාව සඳහා ස්තූපය මැදිකොට ඉදිකර තිබූ ගොඩනැගිල්ල හැඳින්වෙන්නේ,
(1) පටිමාඝර නමිනි. (2) චෛතියඝර නමිනි. (3) බෝධිඝර නමිනි. (4) වාහල්කඩ නමිනි.

40. සිංහල කැටයම් ශිල්පියාගේ විශිෂ්ට කලා කුසලතාව පෙන්නුම් කරන නිර්මාණයක් සඳහා දැක්විය හැකි හොඳ ම නිදසුනක් වන්නේ,
(1) පොළොන්නරුවේ තිවංක පිළිම ගෙයි ඇති ඇවිදින ඉරියව්වෙන් යුතු බුදු පිළිමයයි.
(2) අවුකන බුදු පිළිමයයි.
(3) අනුරාධපුරයේ බිසෝ මාලිගය අසල පිහිටි සඳකඩපහණයි.
(4) අනුරාධපුරයේ ථූපාරාමය වටා ඇති ගල් කණු පෙළයි.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2012 දෙසැම්බර්

General Certificate of Education (Ord. Level) Examination – December 2012

බුද්ධ ධර්මය II

Buddhism II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10ක් බැගින් ද හිමි වේ.

01. (i) සැරියුත් මුගලන් අගසවු දෙනම ගිහි කාලයේ දී හැඳින්වූ නම් **දෙක** ලියන්න.

(ii) 'ධාර්මික සරල ජීවිතයකට හුරු පුරුදු වූ තරුණ යුවළ තමන්ට ලැබෙන ආදායමට අනුව වියදම් කිරීමට වග බලා ගත්හ.' මෙය හැඳින්වීමට ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ භාවිතකොට ඇති යෙදුම ලියන්න.

(iii) ''අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ'' මෙම ධම්ම පද පාඨයේ අදහස ලියන්න.

(iv) 'සිව් බඹ විහරණ' නම් කරන්න.

(v) 'දානං සීලං ච නෙක්ඛම්මං ....' යන ගාථාවෙන් ඉගැන්වෙන ධර්ම කරුණු හඳුන්වන නම කුමක් ද?

(vi) ''සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරාගනිව්.'', යන උද්ඝෝෂ පාඨය ඉදිරිපත් කරමින් බුද්ධගයාව බේරාගැනීමේ දැහැමි අරගලය ගෙන යනු ලැබුවේ කවුරුන් විසින් ද?

(vii) 'සම්මා වාචා' යන්න ධර්මානුකූල ව කෙටියෙන් පහදන්න.

(viii) බුදු පිළිමවල දක්නට ලැබෙන හස්ත මුද්‍රා **දෙකක්** නම් කරන්න.

(ix) බුදුරජාණන් වහන්සේ පිළිබඳ කියවෙන ''සත් හට වන බව දුකට වෙදණන්'' යන්නෙහි අදහස පැහැදිලි කරන්න.

(x) ''අනණ සුඛය'' යන්නෙහි අර්ථය පහදන්න.

02. පාසලේ දෛනික කටයුතු ආරම්භ කරමින් ආගමික වතාවත් සිදු කළ, ස්වාමීන් වහන්සේ මෙසේ පැවසූහ.

''බෞද්ධ දරුවන් විදියට අප ඉගෙනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර ආගම ධර්මය සිහිපත් කර රත්නත්‍රයේ ආශිර්වාදය ලබා ගන්න ඕන. සුළු වේලාවක් මෛත්‍රී භාවනාව වඩා සිතේ එකඟතාව ඇති කරගන්න ඕන. මුලින් ම තිසරණ සහිත පඤ්චසීලය සමාදන් වී තෙරුවන් නැමද ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන්න ඕන.''

මෙම අනුශාසනයේ සඳහන්,

(i) තෙරුවන නම් කරන්න.

(ii) ත්‍රිවිධ චෛත්‍ය ලියන්න.

(iii) දිනපතා ඉගෙනීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර තෙරුවන් නැමදීමෙන් හා මෙත් වැඩීමෙන් බෞද්ධ ශිෂ්‍යයකුට ලැබෙන මානසික සහනය පැහැදිලි කරන්න.

03. (i) චතුරාර්ය සත්‍ය ධර්ම අතුරෙන් **දෙකක්** ලියන්න.

(ii) 'මධ්‍යම ප්‍රතිපදාව' යන්න පැහැදිලි කරන්න.

(iii) පුද්ගලයකුට සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට ආර්ය අෂ්ටාංගික මාර්ගය අදාළ කරගත හැකි ආකාරය පහදන්න.

04. (i) තමන්ට වඩා උසස් අයකු හෝ සමානයකු හෝ ඇසුරු කිරීමට නොමැති නම් හුදකලාව වාසය කිරීම සුදුසු බව අවධාරණය කරමින් දේශනා කළ ධම්ම පද ගාථාව ලියන්න.

(ii) එම ගාථාවේ සඳහන් 'බාලයා' යනු කවුරුන් දැ'යි හඳුන්වන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්ම පදයේ ඇති වටිනාකම ඔබට ඔබට නියමිත ගාථා **දෙකක්වත්** ඇසුරෙන් අගයන්න.

05. (i) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අනුග්‍රහය ලබා දුන් රාජ්‍ය පාලකයාගේ නම සහ එහි දී මූලිකත්වය ගෙන කටයුතු කළ රහතන් වහන්සේගේ නම ලියන්න.

(ii) තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් හේතු සාකච්ඡා කරන්න.

(iii) තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ බුදු සසුනේ දේශාන්තර ව්‍යාප්තිය පිළිබඳ ව විස්තරයක් කරන්න.

EXAMMOOD.LK
EXAMMOOD.LK

06. (i) මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළේ කිනම් පොහොය දිනයක දී ද? එවකට ශ්‍රී ලංකාවේ සිටි පාලකයාගේ නම කුමක් ද?

(ii) ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීමේ පුවත කෙටියෙන් ලියන්න.

(iii) මහින්දගමනය නිසා ශ්‍රී ලාංකික අප ලැබූ දයාද ඇගයීමට ලක් කරන්න.

07. (i) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** ලියන්න.

(ii) එම භාවනා ක්‍රම **දෙක** කෙටියෙන් හඳුන්වන්න.

(iii) බෞද්ධ භාවනාව අසහනකාරී සමාජය සුවපත් කරලීම සඳහා ඉවහල් වන අයුරු විස්තර කරන්න.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK